267

# කුටුම්භ ආදායම් දරුවන්ගේ අධ්‍යාපන වර්ධනය (සාධන මට්ටම) කෙරෙහි ඇති කෙරෙන බලපෑම

ඩබ්ලිව්.ඩී. රත්නාවතී

**ECON/R/099/98**

ප්‍රවේශ අංකය 267
වර්ග අංකය

කැලණිය විශ්වවිද්‍යාලයේ සමාජීය විද්‍යා පීඨයේ ආර්ථික විද්‍යාව පිළිබඳ සමාජීය විද්‍යාපති පර්යේෂණ උපාධිය සඳහා ඉදිරිපත් කරන ලදී.

# නිබන්ධ සාරාංශය

අධ්‍යාපනයෙන් රටක් හෝ සමාජයක් අපේක්ෂා කරන පරමාර්ථ රටින් රටට, කලින් කලට වෙනස් වන නමුත් පොදුවේ ගත්කල එක් අංශයකින් පුද්ගල පරමාර්ථ ඉටුකිරීමක් හා අනෙක් අංශයෙන් සමාජීය පරමාර්ථ ඉටුකිරීමක් සිදුවේ. පුද්ගල පරමාර්ථ ඉටු වීමක් සමගම සමාජීය පරමාර්ථ ද ඉටුවේ. එනම් එමගින් රටේ සංවර්ධනයට අවශ්‍ය මානව ප්‍රාග්ධනය සපයා දීමක් සිදුවේ. රජයක් ප්‍රතිපත්ති සම්පාදනයේදී එරට අධ්‍යාපනය සඳහා සෑහෙන මුදල් ප්‍රමාණයක් වෙන් කරන්නේ අනාගත මානව ප්‍රාග්ධන සම්පත කාර්යක්ෂම අකාරයෙන් සපයාගැනීම සඳහාය. ශ්‍රී ලංකාවේ ද අධ්‍යාපන පද්ධතිය හා ආර්ථික සංවර්ධනය අතර සම්බන්ධතාවය සොයා බැලීමටත්, අධ්‍යාපන ප්‍රතිපත්ති මගින් අපේක්ෂිත පරමාර්ථ ඉටුවී තිබේද නොඑසේ නම් එයට හේතු මොනවාදැයි සෙවීමේ අරමුණින් මෙම නිබන්ධය සකස්කරන ලදී.

ශ්‍රී ලංකාවේ අධ්‍යාපන පද්ධතිය තුල එකම විෂය මාලාවක්, එකම ප්‍රතිපත්ති සමූහයක් සහ ජාතික වශයෙන් අපේක්ෂිත පොදු අභිමතාර්ථ සමූහයක් ක්‍රියාත්මක වුවද දරුවන් අත්කර ගන්නා අධ්‍යාපන ප්‍රතිඵල හෙවත් සාධන මට්ටම් විවිධාකාර ස්වරූපයක් ගනී. එනම් දරුවාගෙන් දරුවාට, පාසැලෙන් පාසැලට, ප්‍රදේශයෙන් ප්‍රදේශයට එම වෙනස්කම් සුවිශේෂී ආකාරයෙන් දකිය හැකිය.

එයට හේතු සෙවීමේ අරමුණ ඇතිව මෙම පර්යේෂණ නිබන්ධය රචනා කරන ලද අතර සමීක්ෂිත ගැටළුව වූයේ දෙමාපියන්ගේ ආදායම් මට්ටම් හා දරුවන්ගේ අධ්‍යාපන සාධන මට්ටම අතර සම්බන්ධය" සෙවීමයි. මෙහිදී දරුවන්ගේ සාධන මට්ටම කෙරෙහි බලපාන විවිධ සාධක සම්බන්ධයෙන් සමීක්ෂණය කරන ලද අතර ප්‍රධාන සාධකය ලෙස දෙමව්පියන්ගේ ආදායම් මට්ටම්වල තත්ත්වය ගැන සලකා බැලීය. දරුවන් අත්කර ගන්නා ඉගෙනුම් ප්‍රතිඵල කෙරෙහි එම සාධකය කෙතරම් දුරට බලපාන්නේද යන්න මූලික අරමුණ කර ගනිමින් මෙම සමීක්ෂණය සිදුකරන ලද අතර අනෙක් සාධක සම්බන්ධව ද තොරතුරු සොයා බලා විග්‍රහ කර ඇත.

මෙම නිබන්ධය සඳහා අවශ්‍ය ප්‍රාථමික දත්ත සපයා ගැනීම සඳහා ශ්‍රී ලංකාවේ ප්‍රාදේශීයව පවතින වෙනස්කම් අනුව ග්‍රාමීය, නාගරික, වතු සහ වියළි කලාපය යන අංශ 4 න්ම නියැදිය තෝරාගෙන ඇත. ඒ ඒ අංශ නියෝජනය වන සේ අහඹු ලෙස තෝරාගත් පාසැල් කීපයක ඉගෙන ගන්නා සාධනය අඩු වැඩි සහ මධ්‍යම යන තුන් වර්ගයේම සිසුන් මේ සඳහා තෝරාගත් අතර; ඔවුන්ට සහ ඔවුන්ගේ ගුරු භවතුන්ගෙන් තොරතුරු ලබාගැනීම සඳහා ප්‍රශ්ණ මාලාවන් 2 ක් ඉදිරිපත් කර ඇත. එම ප්‍රශ්ණ මාලාවන්ට ලැබුනු පිළිතුරු අනුව ලබාගත් පොදු ප්‍රතිඵල ලෙස දරුවන්ගේ සාධන මට්ටම් තීරණය කෙරෙන සාධක වශයෙන්, දෙමව්පියන්ගේ ආදායම් මට්ටම්, සිසුන්ගේ දෛනික පාසැල් පැමිනීම, දෙමව්පියන්ගේ වියදම් ව්‍යාප්තිය තුළ අධ්‍යාපන වියදම් වල ප්‍රමාණය, දෙමව්පියන්ගේ අධ්‍යාපන මට්ටම්, අධ්‍යාපනය ලැබීමට ඇති අභ්‍යන්තර හා

බාහිර පහසුකම් (නිවස් සම්බන්ධ සාධක හා පාසැල හා සමාජය සම්බන්ධ සාධක) යන කරුණු දක්විය හැකිය.

ඒ ඒ සාධකයන්ට සම්බන්ධ අතුරු සාධක ද මෙම සමීක්ෂණය මගින් විග්‍රහකර බලා ඇති අතර අවසාන වශයෙන් නිගමනය කලහැකි වූයේ සිසුන්ගේ සාධන මට්ටම කෙරෙහි බලපාන ප්‍රධාන සාධකය ලෙස දෙමව්පියන්ගේ ආදායම් මට්ටම් වල තත්ත්වය දක්විය හැකි බවයි. අනෙකුත් සාධකයන්ගේ තත්ත්වය සොයා බලන විටද බොහෝ අවස්ථාවල එකී සාධකයන් කෙරෙහිද සෘජුවම හෝ වක්‍රව දෙමව්පියන්ගේ ආදායම් තත්වයන්ගේ බලපෑම දක්නට ලැබුනි. උදාහරණ ලෙස දරුවන්ගේ පාසැල් පැමිණීම බොහෝ දුරට අඩුනම් සාධනය අඩුවූ අතර, පාසැල් පැමිණීම අඩුවීමට බලපාන ලද කරුණු අතරින් වැඩි බලපෑමක් ඇති කරන ලද්දේ දෙමව්පියන්ගේ අඩු ආදායම් තත්ත්වයයි.

එසේ බලන කල සමීක්ෂණ ගැටළුව තුළ ප්‍රධාන සාධකය වූ දෙමව්පියන්ගේ ආදායම් තත්වය දරුවන්ගේ සාධන මට්ටම් තීරණය කෙරෙන ප්‍රධාන සාධකය බවට නිගමනය කර ඇත.

22-11-2003